# ශ්‍රී ලංකාවේ සමකාලීන අධ්‍යාපන ගැටලු

**එච්.එම්. ලලිතා කුමාරි**

## හැඳින්වීම

අධ්‍යාපනය යනු රටක සංවර්ධනය තීරණය කරන ප්‍රධාන සාධකයකි. මන්ද අධ්‍යාපනයේ රටක සංවර්ධනයට අවශ්‍ය මානව ප්‍රාග්ධනය තීරණය කරන බැවිනි. අනාගත සමාජ සංවර්ධනයේ ලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීමේ වගකීම පැවරී ඇත්තේ අධ්‍යාපනයට යි (ෆෝරේ,1 972). එබැවින් රටක අධ්‍යාපනය මෙහෙයවිය යුත්තේ නොදත් ළමයි නොදත් ලෝකයක් සඳහා පුහුණු කිරීමටත්, අද පවතින ලෝකය සහ අනාගත ලෝකය වඩා හොඳ ස්ථානයක් බවට පත් කිරීමටත් අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා ලබා දීමට ය. අනාගතය සඳහා සූදානම් වීමට කැමති සියලු දෙනා අධ්‍යාපනය වැදගත් සහ ප්‍රධාන අවශ්‍යතාවක් ලෙස සලකන අතර අධ්‍යාපනයට හිමිවිය යුත්තේ අතිශය වැදගත් ස්ථානයකි (ෆෝරේ, 1972; බුත්පිටිය, 1999).

අනාගත ලෝකයට සිසුන් පුහුණු කිරීම සඳහා අතීතයේ දී ත්, වර්තමානයේ දී ත් එමෙන් ම අනාගතයේ දී ත් වැදගත් වන ආයතනය වනුයේ පාසල යි. මේ බව තහවුරු කරන ෆෝරේ (1972) පාසල හඳුන්වනුයේ අනාගත පරම්පරාවට අධ්‍යාපනය ක්‍රමානුකූල ව බෙදා දීමට සැලසුම් කරන ලද ආයතනය ලෙසිනි. මේ අනුව රටකට, සමාජයකට වැඩදායි මිනිසුන් නිර්මාණය කිරීමේ තීරණාත්මක ආයතන වශයෙන් අධ්‍යාපන ආයතන හඳුනාගත හැකි ය (ප්‍රේමරත්න, 1991). මේ අනුව පාසල යනු ගොඩනැගිලි සංකීර්ණයක් හෝ රාජකාරිය සඳහා වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවක් හෝ නොව ස්ත්‍රී පුරුෂ ළමා ළපටි පිරිසක් හා උද්යෝගයෙන් යුක්ත ව ඵලදායි වැඩ කොටසක් අනුගමනය කරන මනාව සකස් වූ ප්‍රජා මණ්ඩලයක් වශයෙන් හැඳින්විය හැකි ය.

පාසල මෙන් ම අනෙකුත් අධ්‍යාපන ආයතන අධ්‍යාපන පද්ධතියේ උප පද්ධතියක් ලෙසින් හඳුනාගත හැකි ය. එමෙන් ම සමාජය නියෝජනය කරන සංවිධානයක් වශයෙන් ද පාසල

හඳුනාගත හැකි ය. පාසල සමාජය විසින් නිශ්චිත අභිප්‍රායන් සපුරා ගනු පිණිස නිර්මාණය කොට පවත්වා ගෙන යනු ලබන සංවිධානයකි (ෆෝරේ, 1972; ජයවීර, 2002; බුත්පිටිය, 1999; බංඩා, 1991). මේ නිසා සෑම සමාජයක ම නව සාමාජිකයින් සමාජයට හුරු කිරීම හෙවත් සමාජානුයෝජනය සඳහා පිහිටුවාගෙන ඇති ආයතන අතුරින් පාසල ප්‍රබල වැදගත්කමක් ඇති ආයතනයක් බව පට්ටියගොඩගේ (2005) පැහැදිලි කරයි. මේ නිසා පාසල හා සමාජය අතර අන්‍යෝන්‍ය සජීවී සම්බන්ධතාවක් පවතී. සමාජ සංවිධානයක් වශයෙන් අධ්‍යාපනයේ නවීකරණයන් පිළිබඳ අත්දැකීම් ලබා දීමේ කාර්යභාරය ඉටු කිරීමේ වගකීම පාසලට මෙන් ම සෙසු අධ්‍යාපන ආයතන වෙත ද පැවරී තිබේ. අනාගතය සඳහා යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමට පාසල දායක විය යුතුය. කාලයක් තිස්සේ යම්කිසි සමාජයක් විසින් හැඩගස්වන ලද අධ්‍යාපන ක්‍රමය එම සමාජයේ ස්වභාවයන් අනුව සකස් වී පාසල මගින් සමාජයට සේවා රැසක් ඉටු කරනු ලැබේ (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 1992; කන්නන්ගර, 1943).

1543 දී පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවේ බටහිර පන්නයේ ද්විතීය පාසල ආරම්භ කළ අතර වර්තමානයේ ක්‍රියාත්මක වන ද්විතීය පාසල එංගලන්ත ග්‍රැමර් පාසලේ පිටපතක් ලෙස වර්ධනය වී ඇත. එසේ ආරම්භ වූ විධිමත් පාසල සංඛ්‍යාත්මක වත්, ගුණාත්මක වත් අද වන විට විවිධ වෙනස්කම්වලට හසුවෙමින් පරිණාමනය වී තිබේ (උඩගම, 2003). දසදහස ඉක්මවන ශ්‍රී ලංකාවේ පාසල් සියල්ලට ම සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය විසින් විවිධ පියවර ගෙන ඇත (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2003). මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැමට අධ්‍යාපන වැඩසටහන, තිරසර සංවර්ධන අරමුණු ආදිය සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා භාවිතයට ගනු ලබන ජාත්‍යන්තර වශයෙන් ද ක්‍රියාත්මක වන සම්මතයන් ය (ගුණපාල,2005, ගුණසේකර ඇතුළු පිරිස, 2010; අතුකෝරාල, 1990; අබේපාල, 2016; යුනෙස්කෝව, 2019).

එම ජාත්‍යන්තර සම්මතයන්ට අනුගත වෙමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සමසාධාරණත්වය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක

කරන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් රාශියකි. මානව අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පාසල් සිසුන්ට නොමිලයේ නිල ඇඳුම්, පෙළ පොත්, දිවා ආහාර ලබා දීම, සැමට අධ්‍යාපන වැඩසටහන් සහ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම, ගුණාත්මක යෙදවුම් ලබා දීම, පාසල් පාදක ඉගනුම් ප්‍රවර්ධන ප්‍රදාන ලබා දීම, දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපනය තහවුරු කිරීම, ළඟ ම පාසල හොඳම පාසල වැඩසටහන, අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශ රාමු වැඩසටහන්, සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යන වැඩසටහන් මෙසේ ක්‍රියාත්මක වේ (සේනාරත්න, 1999; කරුණාරත්න, 2018; අධ්‍යාපන අමාත්‍යංශය, 2013, අධ්‍යාපන අමාත්‍යංශය, 2007; අධ්‍යාපන අමාත්‍යාංශය 2018; ප්‍රේමරත්න, 1991).

මෙසේ සමසාධාරණත්ව ප්‍රතිපත්ති සහ සමානාත්මතාවය සඳහා විවිධ ප්‍රතිපත්ති මෙන් ම වැඩසටහන් තිබිය දීත් පාසල් අතර විෂමතා පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සංගණන දත්තවලට අනුව පැහැදිලි වේ. (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2003) 2002 දී රජයේ පාසල් අතරින් සිසුන් දාහට වැඩි පාසල් 6.1% ක් ද, සිසුන් සියයට අඩු පාසල් 27.4%ක් ලෙස විෂමතාවක් පැවතිණි. අධ්‍යාපන අමාත්‍යංශයේ 2017 පාසල් සංගණන දත්තවලට අනුව මෙය තව දුරටත් වර්ධනය වී ඇති බව තහවුරු වේ. සිසුන් දාහට වැඩි පාසල් 9.5% ද, සිසුන් සියයට අඩු පාසල් 29.9%ක් ද ලෙස විෂමතාවක් පැවතිණි. මේ අනුව අධ්‍යාපන පද්ධතිය තුළ ද්විවිධ සීමාන්තිකරණයක් එනම් වඩාත් විශාල පාසල් සහ වඩාත් කුඩා පාසල් පවතින බව හඳුනා ගත හැකි ය. මේ අනුව පාසල් අතර විෂමතාවක් පවතින බව පැහැදිලි වේ. ජාතික පාසල් හා සැසැඳීමේ දී සිසුන් පනහට අඩු පාසල්වලට සම්පත් බෙදී යාමේ අසමානතාවක් පවතින බව මහ බැංකු වාර්තාවෙන් (2013) අනාවරණය වෙයි. මේ නිසා පාසල් අතර නාගරික, ග්‍රාමීය වශයෙන් ද, දිස්ත්‍රික්ක මට්ටමෙන් ද විෂමතා පවතින අතර සැමට සමාන අධ්‍යාපත අවස්ථා ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය සරදමට ලක් වී ඇත (ජාතික අධ්‍යාපන කොමිෂත් සභාව, 2003; අධ්‍යාපන අමාත්‍යංශය 2007).

මේ ආකාරයට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කරගෙන විවිධ වැඩසටහන් විවිධ කාලවල දී සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබුවත් නිදහස් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ තවදුරටත් විසඳීමට ඉතිරි ව තිබෙන ගැටලු ගණනාවක් හඳුනාගත හැකි වන අතර එකී ගැටලු පහත අංශ යටතේ ගොනු කළ හැකි ය.

1. අධ්‍යාපනයේ සාධාරණත්වය හා සහභාගිත්වය පිළිබඳ ගැටලු
2. අධ්‍යාපනයේ අදාළත්වය පිළිබඳ ගැටලු
3. අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ ගැටලු
4. අධ්‍යාපනයේ සම්පත් හිඟකම පිළිබඳ ගැටලු
5. අධ්‍යාපන පද්ධතියේ වගවීම හා කාර්යක්ෂමතාව පිළිබඳ ගැටලු
6. අධ්‍යාපන පද්ධතියේ සම්බන්ධතා හා සම්බන්ධීකරණය පිළිබඳ ගැටලු

**01. අධ්‍යාපනයෙන් සාධාරණත්වය හා සහභාගිත්ව පිළිබඳ ගැටලු**

අධ්‍යාපනයෙන් සාධාරණත්වය යන්නෙන් අදහස් වන්නේ සෑම සිසුවෙකුට ම එක සමාන සාධාරණ අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාව හිමිවීමයි. එමෙන් ම අධ්‍යාපනයේ සහභාගිත්වය යන්නෙන් අදහස් වන්නේ, පාසල් යාමට සුදුසු වයසේ පසු වන සියලුම සිසුන් පාසල් අධ්‍යාපනයට යොමු වීම යි. මේ පිළිබඳ පර්යේෂණ කරන විවිධ පර්යේෂකයින් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සාධාරණත්වය හා සහභාගීත්වය සතුටුදායක මට්ටමක නොපවතින බව යි (ඒකනායක ඇතුළු පිරිස, 2002; බණ්ඩා, 1991). මේ සඳහා බලපාන ලද හේතු ගණනාවක් පවතින බව පෙන්වා දෙන ඔවුන් ඒ අතර පහත සඳහන් හේතූන් සුවිශේෂී ව දක්වයි.

a) අධ්‍යාපනයේ ප්‍රාදේශීය විෂමතා විශාල ලෙසින් පැවතීම.

b) ප්‍රමාණවත් අධ්‍යාපන පහසුකම් නොමැති වීම.

c) සමාජ ආර්ථික සාධකවල බලපෑම.

d) වඩාත් හොඳ පහසුකම් සහිත පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට දෙමාපියන් පෙළඹීම.

e) විෂය බාහිර ක්‍රියාකාරකම් නොමැතිවීම.

f) පුහුණු පළපුරුදු ගුරු හිඟය

g) භෞතික සම්පත් ප්‍රමාණවත්ව නොතිබීම හා පාසල් වර්ග අතර විශාල විෂමතා රාශියක් පැවතීම

h) අවිධිමත් ලෙස පාසල් ඇරඹීම හා නියමිත නිර්ණායකවලට අනුව ආරම්භ නොවුණු පාසල් වැසී යාම

අධ්‍යාපනයේ සහභාගිත්වය පිළිබඳ ගැටලු විසඳා ගැනීම කෙරෙහි අවධානය යොමු වීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන අධ්‍යාපනඥයන් දක්වනුයේ සහභාගිත්ව ප්‍රශ්නය කෙරෙහි දෙමාපියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය මෙන්ම දරිද්‍රතාවය ප්‍රබල ලෙස බලපෑම් කර ඇති බව යි. දෙමාපියන්ගේ දිළිඳුකම, දරිද්‍රතාව අධ්‍යාපනයේ සාධාරණත්වය මෙන් ම සහභාගීත්වයට ද බලපෑම් කෙරේ. පාසල් යන වයසේ දරුවන් විවිධාකාර වූ ජීවනෝපාය මාර්ගයන් වෙත යොමු වීමේ ප්‍රවණතාව ද හඳුනාගත හැකි වන අතර මෙවැනි ගැටලු විසඳීමට ශ්‍රී ලංකා රජය නිදහස් අධ්‍යාපනය ආරම්භයේ සිට ම විවිධ උත්සාහ ගත් අතර ඒවා අතර මධ්‍ය විද්‍යාල හා ජාතික පාසල් සංකල්ප හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම, පොත් පත් නිලඇඳුම් නොමිලේ ලබාදීම, පාසල් රජයට පවරා ගැනීම, මව් බසින් ඉගැන්වීම ආදිය එකී ප්‍රයත්න වූ අතර මෙම ගැටලුව තවමත් විසඳීමට ඉතිරිව තිබීම අභාග්‍යයකි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සහභාගිත්වය 100% දක්නට නොලැබෙන බවත් 15% ක් පමණ සිසුන් තාමත් පාසල් නොපැමිණෙන බවත්, විශාල සිසුන් ප්‍රතිශතයක් පාසල් චක්‍රය අවසන් නොකරන බවත්, අතරමඟ දී ඔවුන් ඇදහැලෙන බවත් විවිධ පර්යේෂණ මගින් සොයා ගෙන තිබේ.

## 2. අධ්‍යාපනයේ අදාළත්වය පිළිබඳ ගැටලුව

අධ්‍යාපනයේ අදාළත්වය යන්නෙන් අදහස් වන්නේ, පාසල් සිසුන්ට ලබා දෙන අධ්‍යාපනය පුද්ගලයන්ගේ හා සමාජයේ අවශ්‍යතාවයන්ට ගැළපේ ද, සිසුන් සමාජයට ප්‍රයෝජනවත් මෙන් ම වගකීමෙන් යුතුව ක්‍රියා කරන්නන් බවට පත් කරන්නේ ද, අනාගත අභියෝග වලට මුහුණ දීමට  සිසුන් සූදානම් කරන්නේ ද යන්න මෙන් ම සිසුන් වැඩ ලොවට පිවිසීම සඳහා සූදානම් කරන්නේ ද යන්නයි (සෙනෙවිරත්න 2011; 2014). අධ්‍යාපනයේ අදාළත්වය පිළිබඳ දේශීය මෙන්ම විදේශීය පර්යේෂණ ගණනාවක් සිදු කර තිබෙන අතර විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අදාළත්වය සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ ගණනාවකින් ම (1989 කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය, 1995; 2010; 2014) පෙන්වා දෙනුයේ වෙළෙඳපොළ අපේක්ෂා කරන හැකියා අධ්‍යාපනයෙන් ලබා දීමට අසමත් වී ඇති බවයි. විශේෂයෙන් ම පෞද්ගලික අංශය අපේක්ෂා කරන හැකියාව ලබා දීමට පාසල් අධ්‍යාපනය අසමත් වී ඇති බවත් ඒ නිසාම අධ්‍යාපනයේ අදාළත්වය පිළිබඳ විවිධ ගැටලු රාශියක් පැන නැගී ඇති බවත්, බොහෝ පර්යේෂකයන් පෙන්වා දේ. (රූපසිංහ 2006; සෙනෙවිරත්න, 2014) එකී ගැටලු අතර තරුණ අසහනය, සමාජ අසහනය ඉහළ දැමීමට හේතු වීම, අභියෝග ජය ගැනීමට සමත් පෞරුෂ ගොඩ නැගීමට අසමත් වීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගතානුගතික ස්වරූපය නිරන්තරයෙන් ප්‍රදර්ශනය වීම හා ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගැන්වීම් ක්‍රම අවම වශයෙන් ක්‍රියාත්මක වීම, ප්‍රජාතන්ත්‍රිය පන්ති කාමර සංස්කෘතියක් බොහෝ පාසල්වල නොමැති වීම යනාදී වූ ගැටලුකාරී තත්ත්වයන් නිසා අධ්‍යාපනය සමාජ ප්‍රගමනයට දායක නොවන බව ඔවුන් පෙන්වා දෙයි. විවිධ කාල වකවානුවල විවිධ අධ්‍යාපන යෝජනා හා ප්‍රතිසංස්කරණ සිදු කරමින් විෂයමාලාවන් වෙනස් කළත්, ප්‍රාග් වෘතතීය  වැනි විෂයයන් හඳුන්වා දෙනු ලැබූවත් එකී ප්‍රතිසංස්කරණ අපේක්ෂා කළ පරිදි ක්‍රියාත්මක නොවීමෙන් තවදුරටත් අධ්‍යාපනයේ අදාළත්වය පිළිබඳ ගැටලුව විසඳීමට ඉතිරිව තිබෙන බව අධ්‍යාපන විද්වතුන්ගේ මතය යි. එබැවින් අධ්‍යාපනයේ අදාළත්වය ආරක්ෂා කර ගැනීමට උචිත ප්‍රතිපත්ති හා අධ්‍යාපන සැලසුම් කඩිනමින් සකස් කර ක්‍රියාවට නැංවීම කාලීන අවශ්‍යතාවයක් බවට පත් ව තිබේ.

### 3. අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ ගැටළුව

එක්සත් ජාතීන්ගේ සංවිධානය (2015) සඳහන් කරනු ලබන්නේ ධරණීය සංවර්ධන අරමුණු අතුරින් හතරවන අරමුණ වනුයේ සැමට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමයි. අධ්‍යාපනයේ ගුණාත්මක බව යනුවෙන් අදහස් කරනුයේ අන්තර්කරණ (inclusive) සහ සාධාරණ (equitable) අධ්‍යාපනයක් ලබා දෙමින් ජීවිත කාලය පුරාවටම අධ්‍යාපනයේ නිරත වීමට අවශ්‍ය පරිසරය සකසමින් ඵලදායි, කාර්යක්ෂම ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලියක් පන්ති කාමරයේ සිදු කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් සපයා දෙමින් සමාජයට වැඩදායි නිමවුමක් පාසල් පද්ධතියෙන් සමාජයට දායාද කිරීම යි. එබැවින් ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා අධ්‍යාපනයේ මූලික අවශ්‍යතා වන පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍ය සම්පන්න ආහාර මෙන් ම සිසුන්ට මුහුණ දීමට වන අවදානම් අවම කරමින් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හරහා පන්තිකාමරයේ ක්‍රියාශීලී දරුවන් ලෙසින් ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධවීමේ අවස්ථා සම්පාදනය කිරීම අතිශය වැදගත් වේ (UN, 2015). අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා භාවිතයට ගත හැකි නිර්ණායක කීපයක් ම (සෙනෙවිරත්න, 2014) ඉදිරිපත් කර තිබේ. ඒවා අතුරින්,

01. සිසුන් ඇද ගැනීමට හා රඳවා තබා ගැනීමටත්, සිසු පෙළඹවීම වර්ධනය කිරීමටත් පාසලේ ඇති ආකර්ෂණීය භාවය තහවුරු කරන ප්‍රධාන සාධක කිහිපයකි.

a) ගුරු කැපවීම ඉහළ මට්ටමක තිබීම.

b) පාසල් කළමනාකාරිත්වය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව ඉහළ දැමීම කෙරෙහි ම යොමු වීම.

c) සිසුන්ගේ අධ්‍යාපන සාධනය අඛණ්ඩව ඉහළ මට්ටමෙන් පවත්වා ගෙන එන පාසල් ඉතිහාසයක් තිබීම.

d) විනය ඉහළ මට්ටමින් ආරක්ෂා කිරීම.

02. පාසල්වල ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක භෞතික පහසුකම් පැවතීම.

03. පුහුණු ගුරුවරුන් පාසැල්වල සිටීම. (සෑම විෂයක් ම ඉගැන්වීම සඳහා).

04. සෑම විෂය ධාරාවක් ම පාසල්වල ක්‍රියාත්මක වීම (කලා, වාණිජ, විද්‍යා හා ගණිත යන).

05. සිසුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය.

06. අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කර ගත් පාසල් පාදක ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීම.

කෙසේ වුවත් ලංකාවේ අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ ව අධ්‍යයනයන් දියත් කරන පර්යේෂකයින් පෙන්වා දෙනුයේ සිසුන්ට අධ්‍යාපනය කරගෙන යාමට අවශ්‍ය මූලික පහසුකම් වත් නොමැති පාසල් සැලකිය යුතු ප්‍රමාණයක් පවතින බවත් මේවා ග්‍රාමීය වශයෙන් මෙන් ම නාගරික වශයෙන් ද විසිරී පවතින බවත් ය. විශේෂයෙන් ම ලංකාවේ පාසල් අධ්‍යාපනයේ දක්නට ලැබෙන පාසල් වර්ගීකරණය තුළ විශාල වශයෙන් විෂමතා පවතින බව ඔවුන් තවදුරටත් පෙන්වා දෙන අතර මෙම තත්ත්වය සෘජුව ම අධ්‍යාපනයේ ගුණාත්මක බව පහත වැටීමටත් එම නිසා ම අධ්‍යාපනයේ ගුණාත්මක බව ආරක්ෂා කර ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය විසඳා ගැනීමටත් ඉතිරිව තිබෙන බව ඔවුන්ගේ අදහස යි.

### 4. අධ්‍යාපනයේ සම්පත් හිඟකම පිළිබඳ ප්‍රශ්නය

අධ්‍යාපනයේ සම්පත් හිඟකම පිළිබඳ ප්‍රශ්නය වූ කලී බොහෝ දියුණු වෙමින් පවතින රටවල්වලට පොදු වූ ප්‍රශ්නයක් ලෙසින් බොහෝ පර්යේෂකයන් හඳුනාගෙන තිබේ. විශේෂයෙන් ම මෙම රටවල්වල මූල්‍ය සම්පත්වල හිඟය සෘජු වශයෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක බව පහත වැටීමට හේතු වේ. මන්ද අනෙකුත් සියලු ම සම්පත්වල සැපයුම රඳා පවතිනුයේ මූල්‍ය සම්පත් මත වන බැවිනි. නිදහස් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික වියදම පිළිබඳ ව පවතිනුයේ සතුටුදායක මට්ටමක් නොවේ (සෙනෙවිරත්න, 2006; 2010; 2014). විවිධ සමාජ ආර්ථික ප්‍රශ්න රාශියක් හමුවේ අධ්‍යාපන වියදම අඛණ්ඩව සීමා වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. අධ්‍යාපනයට වැය කරන මුළු මුදලින්

85%ක්ම ගුරු වැටුප් සඳහාත්, ඉතිරි 15% අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනිකුත් සියලු අංශ සඳහාත් යෙදවෙන බව පර්යේෂණ මගින් පෙන්වා දෙන අතර මෙම තත්ත්වය රටක අධ්‍යාපනයේ ගුණාත්මක බව පිරිහීමකට හේතුවන බව හඳුනාගෙන තිබේ.

විශේෂයෙන් ම අධ්‍යාපනයේ සම්පත් හිඟකම ඉතා දැඩි ලෙසින්ම බලපානුයේ දෙක වර්ගයේ හා තුන වර්ගයේ පාසල්වලට බව (පෙරේරා, 2012) දක්වා තිබේ. මේ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වැනි ආයතන මගින් අධ්‍යාපනයට ලබා දෙන විදේශ ණය හා මූල්‍යාධාර අධ්‍යාපනයේ යටිතල පහසුකම් සපුරා ගැනීමට කාර්යක්ෂම ව හා ඵලදායීව යෙදවීමේ අවශ්‍යතාව හා වැදගත්කම ඔහු අවධාරණය කර තිබේ. පාසලක ගුණාත්මක සංවර්ධනයක් අරමුණු කරගත් අධ්‍යාපනික වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි පාසල් පරිපාලනයේ යොමු වීමත් එයින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සහතික කිරීමත් කාලීන වශයෙන් වැදගත් වේ.

මේ සඳහා පාසල් කළමනාකරුවන්ට මෙන් ම ගුරුවරුන් ද එකට එකතුව සම්පත් සොයා ගැනීමේ විවිධ මාර්ග පිළිබඳ ව ගවේෂණය කිරීම, පර්යේෂණයන් දියත් කිරීම හා ඒ හරහා සම්පත් දායකයන්ගේ සහයෝගය ලබාගැනීම කෙරෙහි යොමුවීම ද මෙම ගැටලුව යම්තාක් දුරකට හෝ විසඳා ගැනීමට හේතුවන බව (පෙරේරා, 2012) තව දුරටත් අවධාරණය කෙරේ.

## 5. අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාව හා වගවීම පිළිබඳ ප්‍රශ්නය

කාර්යක්ෂමතාව (Efficiency) යන්නෙන් අදහස් කරනුයේ පවතින සියලුම සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමටත්, සම්පත් නාස්තිය වළක්වා ගැනීමටත් ක්‍රියාත්මක වීමත් ය (Jonson, 2010). උදාහරණ වශයෙන් මානව සම්පත, භෞතික සම්පත, කාල සම්පත මෙන් ම මූල්‍යමය සම්පත් යනාදිය අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා භාවිතයට ගැනීම ඉතාම වැදගත් වුවත්, පර්යේෂකයන් පෙන්වා දෙනුයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ පවතින සම්පත් කාර්යක්ෂම ව භාවිත නොවන බවත් අපතේ යාම් විශාල වශයෙන් දැක ගැනීමට

ලැබෙන බවත් ය (පෙරේරා, 2013; 2015). එබැවින් පවතින සියලු සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා අධ්‍යාපන නිලධාරීන් අඛණ්ඩ පුහුණුවීම් වලට යොමු කිරීමත්, තිබෙන පුහුණු අවස්ථා වැඩි කිරීමත් සිදු කළයුතු බව සෙනවිරත්න (2013) පෙන්වා දී තිබේ. මේ තත්ත්වය අධ්‍යාපන පද්ධතියේ වගකීම (Responsibility) හා වගවීම (Accountability) ඉහළ මට්ටමකට ගෙන ඒමටත් ඒ තුළින් අධ්‍යාපනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ දමා ගැනීමටත් හේතු වේ. මේ නිසා ගුරුවරුන්, විදුහල්පතිවරුන් මෙන් ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත සෙසු සියලු ම නිලධාරීන් සඳහා අඛණ්ඩ පුහුණු අවස්ථා හඳුන්වා දෙමින් පද්ධතියේ කාර්යක්ෂමතාව හා සම්බන්ධ වගවීම ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු වීම කාලීන අවශ්‍යතාවයක් බවට පත් ව තිබේ.

### 6. අධ්‍යාපන පද්ධතියේ සම්බන්ධතාව හා සම්බන්ධීකරණය පිළිබඳ ගැටලුව

රටක අධ්‍යාපනය සාර්ථක හා කාර්යක්ෂම ව වුවක් වීමට නම් අධ්‍යාපන පද්ධතියේ පවතින විවිධ ආයතන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් තිබීම වැදගත් වේ. එමෙන් ම එකී විවිධ ආයතන විසින් පිරිනමනු ලබන පාඨමාලා අතර ද සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දේ (Eric, 2015). කෙසේ වුවත් ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ ඇති විවිධ ආයතන වන අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පීඨ, විවෘත විශ්ව විද්‍යාලය මෙන් ම ගුරු විද්‍යාල යනාදිය අතර පවතින සම්බන්ධතාවය සතුටුදායක මට්ටමමේ නොමැති බව සෙනෙවිරත්න ඇතුළු පිරිස දක්වයි (2015). එමෙන් ම ඔවුන් තව දුරටත් පෙන්වා දෙනුයේ මෙම ආයතන එකට එක්ව සාකච්ඡා හා සම්මන්ත්‍රණ පවත්වමින් නව පුහුණු පාඨමාලා සැකසීමක් සිදු නොකරන බවත්, බොහෝ විට එකී ආයතන හුදෙකලා ව පාඨමාලාවන් සැලසුම් කොට ක්‍රියාත්මක කරන බැවින් පාඨමාලා අතර පැවතිය යුතු සම්බන්ධීකරණය නොමැතිවීමෙන් එකී පාඨමාලාවල ගුණාත්මකභාවය සම්බන්ධ විවිධ ගැටලු පැන නැගී ඇති බවත් ය. එබැවින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ආයතන අතර සම්බන්ධතාව

හා පාඨමාලා අතර සම්බන්ධීකරණය ආරක්ෂා වන අන්දමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දීම අවශ්‍ය වන අතර ඒ සඳහා පහත සඳහන් යෝජනා රූපසිංහ (2004) ඉදිරිපත් කර තිබේ.

a) අධ්‍යාපන පද්ධතියේ සෑම අංශයක් ම ආවරණය වන අයුරින් වර්තමාන තත්ත්වයන් ඇගයීම හා ඒ මත පදනම් ව නව වැඩ සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

b) උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්ය මහාචාර්යවරුන් සම්පත් පුද්ගලයන් ලෙස යොදා ගනිමින් නව වැඩසටහන් හඳුන්වා දීම.

c) විවිධ අධ්‍යාපන ආයතන එකතුව වාර්ෂික ව සම්මේලන සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

d) නව වැඩසටහන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම වාර්ෂික ව සිදු කිරීම.

## නිගමනය හා සමාලෝචනය

ඉහත ප්‍රශ්න දෙස අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ තව දුරට ත් විසඳා ගැනීමට ඉතිරි ව ඇති ප්‍රශ්න ගණනාවක් ම පවතින බව ය. විශේෂයෙන් ම දැනුම් සමාජයේ සමාජ ප්‍රාග්ධනය නිර්මාණය කර ගැනීමටත් ඒ තුළින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටත් අධ්‍යාපනය දායක කර ගැනීමට හැකි වනුයේ ඉහත විවිධ අංශ යටතේ හඳුනාගෙන තිබෙන ප්‍රශ්න විසඳා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමෙන් අධ්‍යපනයේ කාර්යක්ෂමතාව හා ගුණාත්මකභාවය සහතික කිරීමෙනි.

## ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය, (2007). *අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන,* අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල:

අධ්‍යාපන අමාත්‍යාංශය (2017). *පාසල් සංගණන දත්ත වාර්තාව,* අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල:

උඩගම. පී. (2003). *නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ඇගයුම්, අභියෝග හා අපේක්ෂා,* කොට්ටාව, සාර ප්‍රකාශන

ඒකනායක, එස්. බී., සේදර එම් යූ. (1989). *සාධන විෂමතා ශ්‍රී ලංකාවේ පාසල් පිළිබඳ අධ්‍යයනයක්,* මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

කුලරත්න, ඩබ්.පි, (2008). *පාසල් නගාසිටුවීම පාර්ශවකරුවන් සඳහා අත්පොත,* අධ්‍යාපන අමාත්‍යංශය, බත්තරමුල්ලඃ

කොඩිතුවක්කු, පි. (2012). *පර්යේෂණ ලෝකයට පිවිසෙමු,* බත්තරමුල්ලඃ පර්යේෂණ හා සංවර්ධන ආයතනය

ගුණසේකර, එස්. (2011). *අපේ අධ්‍යාපනයේ සැබෑ මුහුණුවර,* නුගේගොඩඃ සුනෙර ප්‍රකාශකයෝ

ජයවීර, ඒ. එම්. එස්. (2002). *පාසල් ප්‍රතිව්‍යූහගතකරණය 1999-2003 හා ඉන් පෙර* කොළඹ 10. ගොඩගේ සහ සහෝදරයෝ

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003), *මානව සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ ඉදිරි දැක්ම ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික අධ්‍යාපන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා,* නුගේගොඩ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

පට්ටියගොඩගේ, ආර්. එස්. (2005). *පාසල් වැසී යාම සහ දරුවන්ගේ අනාගතය,* වරකාපොල, ආර්ය ප්‍රකාශකයෝ

බුත්පිටිය. ජේ. (1999). *අධ්‍යාපන ප්‍රතිපත්තිය පරිපාලනය හා කළමනාකරණ ව්‍යවහාර* කර්තෘ ප්‍රකාශනකි.

බංඩා, ඩී. එම්. ටී. (1991). *පාසල් කළමණාකරනයේ මූලිකාංග,* කර්තෘ ප්‍රකාශනකි.

ෆෝරේ, ඊ.(1978) *දිවිපැවැත්ම සඳහා ඉගෙනීම;* ලෝක අධ්‍යාපන වර්තමානය සහ අනාගතය යුනෙස්කෝ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Gamage D.T. (2009). *School Base Management is an Alternative path towards the creative of better quality school*, Kiriella: Center for Education Professional

Ekanayaka, S.B. (2002). *The closure of school from 1991-2001 in the North western Province*, Sri Lanka: National Education Commi